# හැ ඳි න් වී ම

නූතන අධ්‍යාපන මනෝ විද්‍යාවත්, අධ්‍යාපන විද්‍යාවත්, සාකච්ඡාවට භාජනය කරන අධ්‍යයන හා අධ්‍යාපන න්‍යායයන් හා උපාය මාර්ග සියල්ලක්ම පාහේ මීට වසර දෙදහස් පන්සියයකට පමණ ඉහත දී භාරතයේ පහළ වූ අපේ ශාස්තෘන් වහන්සේ වූ ගෞතම බුදුරජාණන් වහන්සේ විසින් විවිධාකාරයෙන් භාවිතා කළ ඒවා බවත්, පසුව ශ්‍රාවකයන් විසින් ඒවා භාවිතා කරමින් උසස් අධ්‍යාපන ක්‍රියාවලියක් බිහිකළ බවත්, දක්නට ඇත. මෙම බෞද්ධ අධ්‍යාපන ක්‍රියාවලියේ අගය ලෝකයාට වටහාදීමට නම් අද බොහෝ දෙනෙකුගේ ඇඟයීමට ලක්වන බටහිර අධ්‍යාපන මූලධර්ම සමඟ බෞද්ධ, අධ්‍යාපන මූලධර්ම සන්සන්දනාත්මකව සාකච්ඡා කරමින් බෞද්ධ අධ්‍යාපන මූලධර්මවල අකාලික වටිනාකම පෙන්වා දිය යුතුයි. එසේම වසර දෙදහසකටත් වඩා වැඩි කාලයක් තිස්සේ සිට බුදුසමයෙන් පෝෂණය වී, බෞද්ධ සංස්කෘතිකාංගයන් ගෙන් ආවරණය වී සිටින අපහට ගැලපෙන ආවේණික වූ අධ්‍යාපන සම්ප්‍රදායක් ගොඩනංවා ගැනීමටත්, නූතන බටහිර අධ්‍යාපන ක්‍රමය නිසා පහළ වූ අර්බුද නිවාරණය කර ගැනීමටත් අතීතයේ තිබූ ස්වයංපෝෂිත සමාජ ක්‍රමය නැවත ඇති කර ගැනීමටත් තුඩු දෙන බෞද්ධ අධ්‍යාපන න්‍යාය හා ක්‍රම ශිල්ප පිළිබඳ විමර්ශනයක් අවශ්‍ය වේ. ඒ සඳහා කරන උත්සාහයක් ලෙස මේ පර්යේෂණ නිබන්ධනය දැක්විය හැකියි.

මෙහි අධ්‍යාපන දර්ශනය හා න්‍යාය පිළිබඳ බෞද්ධ සංකල්ප නම් වූ පළමු පරිච්ඡේදයේ දී මුලින්ම නූතන ලෝකයේ දක්නට ඇති අධ්‍යාපන අර්බුදයේ ස්වභාවයත්, එකී අර්බුද විසඳා ගැනීමට ආගමික අධ්‍යාපනඝ දර්ශනයන් ගෙන් සිදුවන මෙහෙයත් විශේෂයෙන් බෞද්ධ අධ්‍යාපනික සංකල්පය තුළ ඒ සඳහා අවශ්‍ය සියළු උපාය මාර්ග ඇති බවත්, දැක්වුවෙමි. මෙහි දී අද පිළිගන්නා වූ බටහිර අධ්‍යාපන දර්ශනයන් පාරක් පිළිබඳ කෙටි විමසීමක් කළ අතර, ඒවා පිළිබඳ බෞද්ධ අදහස ද කෙටියෙන් ඉදිරිපත් කළෙමි. උදාහරණයක් ලෙස පරමාදර්ශවාදී අධ්‍යාපන දර්ශනය බිහි කළ ප්ලේටෝ

පුද්ගලයා ගේ කායික සංවර්ධනයට වඩා මානසික සංවර්ධනයට මුල් තැනක් දෙමින් අධ්‍යාත්මික භාවය උසස් කොට සලකා ඇත. බෞද්ධ දර්ශනය ද මෙය ඉතා ගැඹුරින් අපේක්ෂා කළ කරුණක් බවත්, එනිසා බෞද්ධ අධ්‍යාපන දර්ශනයෙන් අධ්‍යාත්මික භාවයේ භාස්කම් හෙළි කළ බවත්, මතු කොට ඇත. මෙහි දී " අධ්‍යයන" යන වචන දෙක පිළිබඳ විමසීමක් ද සිදු කරන අතර, බෞද්ධ අධ්‍යාපන දර්ශනයේ හා න්‍යායයේ මූලධර්ම මොනවාදැයි දක්වා ඇත.

බෞද්ධ අධ්‍යාපන පරමාර්ථ හා අරමුණු යන දෙවන පරිච්ඡේදයේ දී මුලින් ම බටහිර අධ්‍යාපනයේ අරමුණු හා පරමාර්ථ පිළිබඳ කෙටි අදහසක් දක්වා බෞද්ධ අධ්‍යාපන පරමාර්ථත් අරමුණුත් විස්තර කළෙමි. නූතන අධ්‍යාපන පරමාර්ථ හා අරමුණු විවිධාකාරයට ඉදිරිපත් වුවත්, බෞද්ධ අධ්‍යාපන පරමාර්ථ හා අරමුණු ඉතා පැහැදිලියි. පුද්ගලයා හා සමාජය යන සංකල්ප දෙක වටාම යන ක්‍රියාවලියක් වූ බෞද්ධ අධ්‍යාපනයේ අරමුණු තමා හා අවට පරිසරය පිළිබඳ යථා තත්ත්වය අවබෝධ කර ගෙන, වත්මන් සමාජයටත්, විපතක් නොවන ආකාරයට, සහජයෙන් ලත් උරුමයන් උපරිම ප්‍රයෝජනයට ගනිමින් පෞරුෂය සකසා ගෙන මිනිස් හැසිරීමේ යථා ස්වභාවය දැන තමා හා අනුන් යන දෙපිරිසටම හානියක් නොවන ආකාරයට ජීවත් වීමයි. මෙය යාවජීව ක්‍රියාවලියක් නොව යාව නිබ්බාණ ක්‍රියාවලියකි. නිර්වාණය පරමාර්ථ කර ගෙන ඒ සඳහා සුදුස්සෙක් වන විට මෙම පරමාර්ථ හා අරමුණු මුදුන් පත්වේ. විචාරශීලී බව, සදාචාරවත් බව, පූර්ණ පෞරුෂය, අකම්පිතව කටයුතු කිරීම, සරළ ජීවිතයට හුරු වීම, සහනශීලී බව, ත්‍යාග බව, මිනිස් අයිතීන් ප්‍රදානය කිරීම ආදි අරමුණු මුදුන් පත් වන විට පරමාදර්ශී පුද්ගලයෙක් නැත්නම් පූර්ණ පෞරුෂයෙන් යුක් පුද්ගලයෙක් බිහිවේ.

තුන්වන පරිච්ඡේදය බෞද්ධ අධ්‍යාපන උපාය මාර්ග හෙවත් අධ්‍යාපන ක්‍රමශිල්ප යයි. අධ්‍යාපන පරමාර්ථ හා අරමුණු මුදුන්පත් කර ගැනීම සඳහාත්, උසස් අධ්‍යාපන ක්‍රියාවලියක් සඳහාත්, අධ්‍යාපනය දීමේ දී භාවිතා කළයුතු මූලධම් මෙහි දී විස්තර කළෙමි. නූතන අධ්‍යාපන මනෝ විද්‍යාවේ ඉගැන්වීම් න්‍යායක් ලෙස සාකච්ඡා කරන්නේ ද මෙයයි. අධ්‍යාපනය සඳහා ශිෂ්‍යයා පොළඹවා ගැනීමට විවිධ උපක්‍රම භාවිතා කළ යුතුයි. බුදුරජාණන් වහන්සේ මනෝ විද්‍යාත්මක ක්‍රම උපයෝගී කර ගනිමින් ශ්‍රාවක පිරිස අධ්‍යාපනය සඳහා පොළඹවා ගෙන ඇත. ඒ සඳහා උපක්‍රම, නූතන අධ්‍යාපන ක්‍රමශිල්ප සමග සන්සන්දනාත්මකව මෙහි දී සාකච්ඡා කළෙමි. වසර දෙදහස් පන්සියයකටත් ඉහත භාවිතා කළ මේ බෞද්ධ අධ්‍යාපන උපාය මාර්ගවල ඉතා උසස් වටිනා කමක් ඇති බවත්, ඒවා නූතන පන්ති කාමරයකට ඉතා උචිත ඒවා බවත් පෙනේ. බෞද්ධ ඉගැන්වීමත්, බෞද්ධ ශිෂ්‍යයාත් කවුරුන්දැයි මුලදීම හඳුන්වා දීමට උත්සාහ ගතිමි. ඒ බෞද්ධ ශිෂ්‍ය පිරිස කේන්ද්‍ර කර ගෙන අධ්‍යාපනය ලබාදුන් බුදුන් වහන්සේ එහි දී නූතන අධ්‍යාපනඥයින් දක්වන ළමා කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමය භාවිතා කළ බව පෙනේ. ළමා කේන්ද්‍රීය අධ්‍යාපනය පිළිබඳ කරුණු දක්වන පෙටසලෙයිසි, ප්‍රොබෙල්, කොමීනියස්, රූසෝ, වැනි අය ඉදිරිපත් කළ න්‍යායයන්ට වඩා ඉතා දියුණු තියුණු උපාය මාර්ග බුදුරජාණන් වහන්සේ භාවිතා කොට ඇත. දේශනා ක්‍රමය, සාකච්ඡා ක්‍රමය, උපමා රූපක භාවිතය, කතන්දර කීම, සංකල්ප මතු කිරීම, සමස්ථය පිළිබඳ මූලධර්ම, පියවර පාඩම් ක්‍රමය, ක්‍රියාවෙන් අවබෝධය ලැබීමේ ක්‍රමය, පුහුණු මාරු ක්‍රමය, ප්‍රතිහාර්ය ක්‍රමය, ආදී වූ විවිධ අධ්‍යාපන ක්‍රමශිල්ප වලින් බෞද්ධ අධ්‍යාපන න්‍යාය පොහොසත් වී ඇති බව දක්වා ඇත.

ගුරු – ශිෂ්‍යය අන්තර් ක්‍රියා නම් වූ හතරවන පරිච්ඡේදයේ දී ගුරු භූමිකාව දැක්වුවෙමි. අධ්‍යාපන ක්‍රියාවලයේ දී ගුරු – ශිෂ්‍යය ක්‍රියාකාරකම් වලට ඉතා උසස් තැනක් හිමි වේ. ශිෂ්‍යයා තම පරමාදර්ශය ලෙස ගන්නේ ගුරුවරයාය. එනිසා ගුරුවරයා අධ්‍යාපනයෙන් දැණුමින්, බුද්ධියෙන් පෙනුමෙන් ආකර්ශනීය විය යුතුය. අනෙක් අතර ශිෂ්‍යයා පිළිබඳව ගුරුවරයා විසින් හැම දෙයක්ම වටහා ගත යුතුය. බෞද්ධ අධ්‍යාපනය මේ අංශ දෙක්හිම පොහොසත්ය. බුදුන් වහන්සේ හොඳ ගුරුවරයෙක් ලෙස සියළුම පෞරුෂ ලක්ෂණ වලින් සමන්විත විය. භික්ෂුවද ගුරුවරු ලෙස බොහෝ කරුණු සම්පූර්ණ කරගත් අයයි. දැණුමින්, බුද්ධියෙන්, අවබෝධයෙන් අඩු භික්ෂුවකට ශිෂ්‍යයෙක් තබාගත නොහැක්ය. ශිෂ්‍යයා පිළිබඳ හොඳ දැණුමක් ගුරුවරයා තුළ තිබිය යුතු නිසා ශිෂ්‍යයා අධ්‍යාත්මයෙන් ම හික්මවන පුද්ගලයා ( උපජ්ඣාය වරයා) ගුරුවරයා ලෙස බෞද්ධ අධ්‍යාපන න්‍යාය දක්වා ඇත. ශිෂ්‍යයා පිළිබඳ ප්‍රත්‍යෙක අධ්‍යයනයක් කරන ආකාරය බෞද්ධ අධ්‍යාපන න්‍යායේ " තම්මට්ඨානාචරිය යන තනතුරින් හෙළිවේ. බෞද්ධ අධ්‍යාපන න්‍යාය ඉතා උසස් ගුරු – ශිෂ්‍ය අන්තර් ක්‍රියාවලියක් නිර්මාණය කළ බව මෙම පරිච්ඡේදයේ දී විග්‍රහ කර ඇත. මෙහි පස්වන පරිච්ඡේදය නිගමනයයි. ඉතා කෙටිම නිගමනය වන්නේ බෞද්ධ සමාජයට පමණක් නොව මුළු ලෝකයටම ගැලපෙන අධ්‍යාපන න්‍යායට අවශ්‍ය මූලධර්ම බෞද්ධ අධ්‍යාපනයේ ඇති බවත්, ඒවා භාවිතා කිරීමෙන් හොඳ උසස් අධ්‍යාපනික ක්‍රියාවලියක් බිහි වී සමාජ අර්බුද නැතිවිය හැකි බවත් ය.